සැකසුම - චතුරිකා ප්‍රියදර්ශනී.
ර/නිවි/කහවත්ත මධ්‍ය මහා විද්‍යාලය

සති පාසල 22

## තොරතුරු පත්‍රිකාව

## කදා වළලු නාට්‍ය

කදා වළලු නාට්‍යය මුලින්ම රචනා කර ඇත්තේ ගුවන් විදුලි නාට්‍යයක් වශයෙනි. සේරිවාණිජ ජාතකය ඇසුරු කොටගෙන කදා වළලු නාට්‍ය රචනා කරන ලදී. 1958/09/06 වන දින බොරැල්ලේ තරුණ බෞද්ධ සමිති ශාලාවේ දී මුල් වරට කදා වළලු නාට්‍ය රඟ දක්වා ඇත. ජාතකයේ සඳහන් කතා පුවත එලෙසින්ම මුල, මැද , අග සහිත ව කදා වළලු නමින් නාටකය රචනා කර ඇති අතර එසේ වුවද ජාතක කතාව සියුම් ලෙස අර්ථ විවරණය කර ඇත.

වෙනත් ජාතක කතා වල බෝධිසත්ව චරිත නාමයෙන් කතාව නම් කර තිබුණද මෙම ජාතකය නම් කර ඇත්තේ දුෂ්ට ගති ඇති " සේරි "නම් වූ වෙළෙන්දාගේ නාමයෙනි. නාටයයෙහි සේරිවාණිජ වෙළෙන්දා ගේ චරිතය වඩාත් ඉස්මතු කර ඇති අතර එම නාට්‍ය නිෂ්පාදනයේ දී සේරි ගේ චරිතය සඳහා දීප්තිමත් ඇඳුම් යොදාගෙන ඇත. තවද ඔහුගේ ගායනා ඉතා කන්කලු නාද රටාවන්ගෙන් යුක්ත වේ.

එහෙත් නාට්‍යයේ ප්‍රධාන චරිතය හිමි වන්නේ කච්ඡපුට නම් වූ බෝසත් චරිතයටයි. කච්ඡපුට යන්න කිසිල්ලේ පසුම්බිය ගසාගෙන යන අරුතින් යොදාගත් පටබැඳි නාමයකි.

අධික තණ්හාව නිසා මිනිසා විනාශය ළඟා කරගන්නා ආකාරයත් , අනුන් රැවටීමෙදී තමා ද රැවටෙන බවත් මෙම නාට්‍ය ලබා දෙන ප්‍රධාන උපදේශයන් ලෙස හැඳින්විය හැකිය.

කපටි වෙළෙන්දෙකු ගේ ගති ලක්ෂණත් එනම් වංක බව , පරිභව කිරීම, පෙළඹ වීම ,යනා දී චරිත ලක්ෂණ ද මෙහි ගැබ් ව ඇත.

**සේරිවාණිජ ජාතක කතාව.**

බුදු රජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වසන සමයේ පසුබට වූ වීර්ය ඇති භික්ෂුවක් උදෙසා සේරිවාණිජ ජාතකය දේශනා කොට ඇත. එක්තරා භවයක සේරිව රාජ්‍යයෙහි වෙළඳ කුලයක උපන් බෝසතුන් කච්ඡපුට යැයි නම් ඇතිව සේරිවාණිජ නම් වෙළඳකු සමඟ අන්ධපුරයේ දෙමඟකින් ගොස් බඩු විකුණන අතරතුර සේරිවාණිජ එක් දුක්පත් සිටු දියණි කෙනෙකුට කදා වළලු විණීමට ගත් උත්සහයේදී දුක්පත්කම නිසා මුදල් නැති බැවින් තම පරපුරේ පළමු මහ සිටාණෝ දන් වළදා ඉවත් කොට මලගැසී ගිය රන්තලිය දී වළලු ගැනීමට තැත් කළ අවස්ථාවේදී එය ගන රන් බව දැක නොවටිනා බව කියමින් ඉවතට විසි කොට උපායකින් එය හැරගනිමි යි සිතා ඉවත් ව ගිය අතරේ එම සිටු මාළිගයට පැමිණ බෝසත් කච්ඡපුට වෙළෙන්දා එම රන් තලියට තමා සතු සියලු කහවණු හා භාණ්ඩ ද දී එය රැගෙන ගියේය. නැවත ආපසු පැමිණි සේරි වෙළෙන්දා සිදු වූ දේ දැන ඔරුවෙන් ගඟෙන් එගොඩ වෙමින් සිටි කච්ඡපුට වෙළෙඳාට සාප කරමින් ළය පැළී ද්වේෂ සහගත ව මිය ගියේ ය. එතැන් පටන් සසරේ විවිධ භවවල දී රැගෙන ආ වෛරය සිද්ධාර්ථ ගෞතම බුදුන් සමය තෙක් රැගෙන ආ අයුරු ජාතක කථාව සංක්ෂිප්ත ව දක්වයි.

**<u>අභ්‍යාසය</u>**

තොරතුරු පත්‍රිකාව ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කදා වළලු නාට්‍ය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. කදා වළලු නාට්‍ය කාගේ නිර්මාණයක්ද?

2. එය මුල් වන රංග ගත කළ දිනය ලියා දක්වන්න.

3. එම නාට්‍ය නිර්මාණයට පාදක වූ කතා වස්තුව කෙටියෙන් ලියා දක්වන්න.

4. එම නාට්‍යයෙන් හා එයට පාදක වූ කතා වස්තුවෙන් ලබා දෙන ලබා දෙන ප්‍රධාන තේමාව හා අතුරු තේමා ලියා දක්වන්න.